

## මේක මාර ගේමක්

ඕසට්‍රේලියාවේ ජීවත්වුණාට සියලුම සැප සම්පත් මෙහෙ ඇවිත් ලබා ගත්තට අපි හැමෝටම වගේ ක්‍රිකට් වලදි පොඩි ඇරියස්



එකක් තිබුණා ඔසියොත් එක්ක. ඒක ඔසියොන්ගෙ ගේම් ඇටිටියුඩ් එකත් එක්ක කළවම් වෙච්ච ටැලන්ට් එක නිසා අපේ යටි හිතේ ඇතිවුණ පොඩි ජෙලසියක් කිව්වොත් වඩා නිවැරදියි. කොහොම කිව්වත් අවසාන විග්‍රහයෙදි අපි හැමෝම එකඟ වෙන කාරණය තමයි මුන් මාර ටැලන්ටඩ් කියන එක.

එහෙම ටැලන්ට් එකක් තියෙන ටීම් එකක අම්බ කොලිටි ලීඩර් කෙනෙක් මේ විදිහෙ පට්ට ගොන් වැඩක් කළේ අහවල් දේකටද කියලා හිතා ගන්න බැහැ. අධෝවාතයක් ගියත් ජේන සයිස් එකට කැමරා අටවලා තියෙන ග්‍රවුන්ඩ් එකක අර වගේ බාල බොළඳ වැඩක් කරනකොට ඇතිවෙන්නෙ කේන්තියකට වඩා මාර දුකක්. අපි පට්ටයි කියලා හිතාගෙන ඉන්නවුන් මෙහෙම ගොන් කියලා දැක්කහම අපට වහ බොන්න හිතෙනවා. ඒත් සහෝ මුන් වැඩේ කරලා අච්චර අඬනවා දැක්කම නම් ඇතිවුණේ හැබෑම දුකක්. උඹලා අපිට මොන ජාති දැම්මත් පොඩි එවුන් වගේ අඬනවා දකින්න අපි ඇත්තටම කැමති නැහැ. කොහොම වුණත් කරපු වැරැද්ද බාරගත් එකටයි ලැබුණ දඬුවම සද්දෙ වහලා පිළිගත්ත එකටයි චූටි මල්ලි සැලියුට් පාරක් දෙනවා.

වෝන නම් අපේ සනා වගේ හතර අතේ වනන එකා. ඒත් ස්ටීව් ස්මිත් කියන්නෙ රියල් ක්‍රිකට් බුවෙක්. මොන වැරැද්ද කළත් බෙල්ලෙන් අල්ලලා එළියට දැම්මත් දාල යන්නෙ නැති උන් ඉන්න ලෝකෙක මේ විදිහට ජනතාව ඉදිරියට ඇවිත් සමාව ගත්ත එකට ඔන්න මං ඩබල් සැලියුට්.

මේ ඔක්කොටම පස්සෙ ඔස්ට්‍රේලියාවෙ ක්‍රිකට් බලධාරීන් ඉගෙනගන්න ඕනෙ දෙයක් තියෙනවා. ඒ තමයි තමන්ගෙ කණ්ඩායමට පරාජය බාරගන්න හැටිත් උගන්නන එක. ඒක නොදන්න නිසා තමයි මේ ඔක්කොම අලකලංචි.

## අප්‍රේල් 5ත් ආවා

අප්‍රේල් 5 ත් පහුවුණා වෙනදා වගේම. සමරන්නෙ හදවතින් විතරයි. විප්ලවවාදී දේශපාලනය නෙවෙයි එදිනෙදා දේශපාලනය ගැනවත් කතා කරන්නෙ නැහැ මේ දවස් වල. ඒ තරමට ලංකාවේ දේශපාලනය අපුලයි. මියැදුන මිනිස්සු ගැන මාර දුකයි. ජීවිත කාලයම යහපත් අරමුණු වෙනුවෙන් කැපවුණ මිනිස්සුන්ගෙ ළමා වියත් තාරුණ්‍යයත් වර්තමානයේ මැදිවියත් දකිනකොට ඊටත් වැඩිය දුකයි.

සාක්ෂරතාව වැඩි රටක මහජන දේශපාලනය කියන්නෙ සාපේක්ෂ වශයෙන් ගුණාත්මකව වර්ධනය වෙන දෙයක්. හැම පැත්තෙන්ම. අපේ රටේ දේශපාලනය හැම අතින්ම මජර අශික්ෂිත පාහර හෝදාපාලුවකට සීඝ්‍රයෙන් ලක්වෙන හැටි දැක දැක මැරුණ මිනිස්සු සමරණ එක එන අතකට මහ විහිලුවක් වගේ.

**සරළ උදාහරණයකට රතුපස්වල දිනන්නෙ උන්ට වෙඩි තියපු මරපු පොහොට්ටුව. රතු**



**පස්වල මිනිස්සු මැරුණ එක ගැන අපි ඇඬුවට උන්ට ඒක ගාණක් වත් නැහැ.**

චූටි මල්ලි මෑත කාලයේ පරණ මතවාදයෙන් ටිකක් ඈත් වෙලා සාධාරණ සමාජයක් අපේ කාලය තුළ ගොඩ නැගේවි කියලා බලාපොරොත්තුවෙන් හිටියෙ. ඒකත් දැන් සිහිනයක් වගෙයි. දේශපාලකයන්ටම දොස් කිය කිය ඉන්න එකේ තේරුමකුත් නැහැ. පට්ට ගොන් මිනිස්සු ඉන්න රටක බහුතර ඡන්දදායකයා කියන්නෙ බුද්ධිමත් නොව ගොන් වාහෙලා රැළක් බව කියන්න තරම් එඩිතර දේශපාලකයෙක් බිහිවුණ දවසක වෙනසක් ගැන බලාපොරොත්තුවක් තියාගන්න පුලුවන් වෙයි. එතකම් මැරුණවුන් ගැන හිත හිත ඉමු.

## ආතල් එක වෙනුවෙන්

මේ කාරණා කියලා ලියලා හදන්නවත් වෙනස් කරන්නවත් පුලුවන් කාරණා නෙවෙයි. පොඩි උණක් තියෙන නිසා හිතට එක ඒව ලියන්න හිතෙනවා. ඕන් දැන් මං ලියනවා. ලංකාවෙන් මෙහාට කොපමණ නම් කලාකාරයෝ එනවද යනවද? එක එක සංදර්ශන වලට. ඒ එන මිනිස්සුන්ට කන්න බොන්න දෙන්න තෑගි දෙන්න මූලිකත්වය ගන්නෙ බොහෝ විට ගෙනවන සංවිධායකයන්ට වඩා සාමාන්‍ය රසිකයෝ. ඒ එන කලාකරුවන්ට ඇති ලැදියාව නිසානෙ. මට මේක ලියන්න හිතුණෙ මේ සංග්‍රහ ලැබෙන ආකාරයේ විවිධත්වය නිසා.

උදාහරණයකට ඊයෙ පෙරේදා ආපු රාජකපුරු කණ්ඩායමේ දහතුන් දෙනාට සළකන්න කොයි තරම් නම් පිරිසක් පොරකකා හිටියද? මෙහේ හිටපු දවස් ගානට දවසේ එක කෑම වේලක් වත් ඉතුරු වුණේ නැහැ. උදේ කෑම වේල පවා එක එක රසිකයෝ වෙන් කරගෙන තිබුණා. ඒක මොන තරම් හොඳද.

ඒත් ඉතින් ඒ එක්කම වගේ මට මතක් වුණේ මාස කීපයකට කලින් මෙහෙ ආව ධර්මරත්න සහෝදරයන්ගෙ සංගීත කණ්ඩායම. ඔවුන් නැවතිලා හිටියෙ සංවිධායකයන් ලෑස්ති කරලා දුන්න ගෙදරක හුදකලාව. හොඳ වෙලාවට කතෝලික සංගමය හා එහි හිතවතුන් ඔවුන්ට අඩුපාඩුවක් වෙන්න ඉඩ තබා තිබුණෙ නැහැ. නමුත් සාමාන්‍ය රසිකයා ඔවුන්ට පැන පැන සැළකීමට ඉදිරිපත් වුණේ නැහැ.

ධර්මරත්න සහෝදරයෝ අපේ සංගීකත ක්ෂෙත්‍රයට කළ සේවය ගැන දන්නෝ දනිති. ඒත් රසික ප්‍රතිචාරය මේ විදිහට අඩු වුණේ ඇයි? අපි හැමෝම කැමති මම අර කලින් කිව්ව පරිදි ආතල් එකටම තමා. ජනප්‍රිය නලුවෙක් හෝ නිලියක් ගෙදරට ගෙනල්ලා කන්න බොන්න දීලා සෙල්ෆි අරන් ෆේස්බුක් දාලා ගන්න ආතල් වගේද පරණ සංගීත කාරයෙක් එක්ක ගන්න ෆොටෝ එකක්ක එෆ්බී එකට දැම්ල්ල. ඒවයෙ තියෙන්නෙ අමුතු ආතල්. යමක් දෙන්නේ තමන්ටත් යමක් ලැබෙනවා නම් තමයි. ඒ ලැබෙන දේ තමන් වටේම ඉන්න අය දැනගන්නවටත් මිනිස්සු කැමතියි. ඒක වෙනමම ආතල්



එකක්.

අන්තිමට ම නම් මට හිතුණෙ මොකා ආතල් ගත්තත් අඩුවෙන් හරි වැඩියෙන් හරි සංග්‍රහ ලැබිලා තියෙන්නෙ අපේ රටේ සැප විඳින්නැති කලාකාරයන්ට නේ කිය කියලා. මේව ඉතින් කාටවත් රිද්දන්න කියන දේවල් නෙවෙයි. අත කසනවට ලියවෙන දේවල්.

### අතුරු කතාවක්

ඒ ආතල් එකේ අග්‍ර ඵලය තමයි අවුරුදු උත්සව අප්පිරියා හිතෙන තරමට නලු නිළියන්ගෙන් පුරවන එක. මේ සැරේ අපේ අයිය කෙනෙක් එක අවුරුදු උත්සවයකටවත් ගියේ නැහැ. "ගියා නම් මිනිස්සු හිතයි මාත් නලු නිළියන් බලන්න ගියා කියලා. මං අවුරුදු පැත්තකට දාලා ගෙදෙට්ට වෙලා නිදා ගත්තා" එයා මට කිව්වා..මේව ගැන කල්පනා කරන්නම වටිනවා. අතිරහ වුණත් හැමදාම කනකොට තිත්ත රහ වෙනවලු. නලුනිලියනුත් එහෙමම තමයි.

## අමතක නොකළ යුතු අපේ මිනිස්සු

දැන් ඕස්ට්‍රේලියාවේ සිංහල අවුරුදු සැමරීම මල් මසුරං. ලංකවේ විදිහටම නැගලා යනවා. ටෙක් එකේ සෙට් එක නිසා අපට හවසට සංගීත සොමියත් ලැබෙනවා. පට්ටයි ඈ..

ඔය කතන්දර අස්සෙ අවුරුදු දෙක තුනක් ලියන්න හිටපු කාරණාවක් අමතක වෙමින් තිබුනා. ඒත් මේ සැරේ මතක් කරලා ලියනවා. අවුරුදු ගැන පත්තර වල ඕනෙ තරම් ලියනවනෙ. නැකැත් ගැන කියන්න වෙලාවල් ගැන කියන්න අදාල දෛවඥයෝ දැන් ඕනෙ තරම් ඉන්නවා. මං මේ කියන්න යන්නෙ ඔස්ට්‍රේලියාවෙ ලොකුම අවුරුදු උත්සවයේ සංවිධානයේ විශේෂ පිරිසක් ගැන. ඒකෙත් විශාල කැපකිරීමක් කරන ඇතුලෙ සෙට් එක ගැන. මං මේ කියන්නෙ අවුරුදු උත්සවේ කියන්නෙ මුලුතැන්ගෙයි සහෝදරයො ගැන.



මුලු මෙල්බනයම එළියෙ එක එක ජාතියෙ ආතල් ගනිද්දි කුස්සියේ සෙට් එක දවස පුරාම උදේ ඉඳන් හවස් වෙනකල් වෙහෙසෙමින් අනිත් අයගෙ සැප වෙනුවෙන් කරන කැප වීම කොච්චරද කියලා ලබන සැරේ උත්සවය බලන්න ආවම නිකමට ඔලුව දාලා බලන්න. මේ සහෝදරවරු උදේ ඉඳන් හවස් වෙනකල් එළියෙ වෙන්නෙ මොකක්ද කියලවත් දන්නෙ නැහැ. ඒක මාර කියන්නෙ මාරම කැප කිරීමක්.

ඒක සංවිධානය කිරීමත් ඒකට ස්වේච්ඡාවෙන් ඉදිරිපත්වීමත් අගය කරන්න මෙච්චර කල් පමාවීම ගැන සමාවෙන්න.

## ෆේස් බුක්

මුලදි ටිකක් නුහුරු වගේ දැනුණාට ෆේස් බුක් එක දැන් අපේ ගෙදර වගේ වෙලා. අපි කන බොන එක විතරක් නෙවෙයි අනිත් වැඩත් දැන් කරන්නෙ ෆේස් බුක් එකේ පින්තූරයක් දාන ගමන්. මේ ළඟ'දි මං දැක්කා බුවෙක් ස්වයංවින්දනයේ යෙදෙන හැටි ෆේස් බුක් එකේ ලයිව් දාලා. අම්මපා මාර සමාජයක් මේක.

මේ ෆේස්බුක් පැණි වරකාවට හෙණ ගැහුවෙ ෆේස්බුක්කාරයා අපේ පුද්ගලික දත්ත විකුණාගෙන කාලා කියලා අහුවුණාට පස්සෙ. අපේ නම්ගම් දුරකතන අංක ඊමේල් ලිපින විතරක් නෙවෙයි අපි ෆේස්බුක් එකේ ලියන දේවල් අනුව අපේ රුචි අරුචිකම් පවා එකතු කරලා විවිධ සමාගම් වලට විකුණලා කියලා දැනගත්තම ඒකට විරෝධය දක්වන්න ජනප්‍රිය පුද්ගලයන් බොහෝ දෙනෙක් තමන්ගෙ ෆේස්බුක් ගිනුම් ඩිලීට් කරලා දැම්මා. ඉතින් පුංචි පහේ මිනිස්සු වෙච්ච අපි තාමත් ෆේස් බුක් එකට වෙලා කනවා බොනවා පණදාගෙන ලියනවා. සකබර්ග් ඒව විකුණගෙන කෝටිප්‍රකෝටි පතියෙක් වෙනවා.
පුංචි අපට මොන පුද්ගලිකත්වයක් ද? නේහ්?

**චූටි මල්ලි**